

# මම කොහොමටවත් පක්ෂ දේශපාලනයට සම්බන්ධ වෙන්නෙ නෑ.

## මනෝ

### ජයලත් මනෝරත්න

නුවරඑළිය දිස්ත්‍රික්කයේ දෙහිපේ ගම්මානයේ පදිංචිව සිටි කෙසෙල්ගස්පේ මනතුංග බණ්ඩාර සහ අගලකොටුව හේරත් මුදියන්සේලාගේ ලීලා කුමාරි දෙපළගේ පවුලේ දෙවන පිරිමි දරුවා ලෙස කෙසෙල්ගස්පේ මනතුංග ජයලත් මනෝරත්න මෙලොව එළිය දුටුවේ 1948 වසරේ ජුනි 12 දිනය. ගමේ පාසල වූ දෙහිපේ මිශ්‍ර පාසලෙන් මුල්පොත කියැවූ ඔහු පසුව පොරමඩුල්ල මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළත්ව උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලැබුවේය. කලා විෂය ධාරාවෙන් උසස් පෙළ සමත්ව පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයට ඇතුළත් වූ හෙතෙම එහිදී ශාස්ත්‍රවේදී උපාධිය ලබාගත්තේය.

උපාධිධාරියෙකු ලෙස පේරාදෙනිය විශ්ව විද්‍යාලයෙන් පිටවන මනෝරත්න තරුණයාගේ මුල්ම රැකියාව වූයේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ අනියම් ලිපිකරු රැකියාවකි. පසුව පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා වරාය කොමිෂන් සභාවේ ලිපිකරුවෙකු ලෙසද, මහවැලි සංවර්ධන මණ්ඩලයේ සංවර්ධන සහකාරවරයෙකු ලෙස ද, මහවැලි අධිකාරියේ ප්‍රජා සංවර්ධන නිලධාරියෙකු ලෙස ද ආදී වශයෙන් රජයේ විවිධ ආයතනයන්හි සේවය කරන්නට ඔහුට සිදුවිය.
පසුව කොළඹ විශ්ව විද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ නාට්‍ය හා රංග කලාව පිළිබඳ බාහිර කථිකාචාර්යවරයෙකු වශයෙන්ද හෙතෙම කටයුතු කළේය.

මනෝරත්නගේ කලා දිවිය ඇරඹෙන්නේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබන සිසුවෙකුව සිටියදීමය. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ වේදිකා නාට්‍ය තුළින් ප්‍රසිද්ධ වේදිකාවට රංගන ශිල්පියෙකු ලෙස එක් වූ මනෝරත්න රාජ්‍ය නාට්‍ය උළෙලේ හොඳම නලුවාට හිමි සම්මානය වසර පහක් හිමිකරත්තේය. 'රතු හැට්ටකාරි' (1974), 'පුත්‍ර සමාගම' (1985), 'තල මල පිපිලා' (1988), 'සොක්‍රටීස්' (1990), 'ද්විත්ව' (1991) එම නාට්‍යයයි. පසුව ස්වතන්ත්‍ර නාට්‍ය නිෂ්පාදකයෙකු වශයෙන් ඔහු වේදිකාවට ගෙන ආ නාට්‍ය බොහොමයක් ද ප්‍රේක්ෂක විචාරක අගැයීමට මෙන්ම විවිධ සම්මාන ප්‍රදානයන්හි දී සම්මානයට ද පාත්‍රවිය. 'තල මල පිපිලා' 1988 වසරේ රාජ්‍ය නාට්‍ය උළෙලේ හොඳම අධ්‍යක්ෂණය සහ හොඳම රචනය ලෙස සම්මාන හිමිකරගත්තේය. 'අන්දරේලා' (1993), සහ 'ගුරු තරුව' (1996), හොඳම රචනය සහ හොඳම නාට්‍ය කෘති ලෙස රාජ්‍ය නාට්‍ය උළෙලේදී සම්මානයෙන් පිදුම් ලැබුවේය. වේදිකාව, සිනමාව සහ රූපවාහිනය යන මාධ්‍ය ත්‍රිත්වයේම එකසේ දක්ෂකම් දක්වා ඇති මනෝරත්න තවමත් කාර්ය බහුල ජීවිතයකට හිමිකම් කියන්නේ කලාකරුවෙකු වශයෙන් ඔහු සතු සුවිශේෂී අනන්‍යතාව හේතුවෙනි.

**මේ දවස්වල මොකද කරන්නේ කියන තැනින් අපේ කතා බහ ආරම්භ කළොත් ?**

මේ දවස්වල නම් හුස්ම ගන්නවත් විවේකයක් නැතුව මගේ අලුත් නාට්‍යයේ වැඩ. මේකෙ පිටපත මම ලිව්වේ ඉන්දියාවේ නව කතාවකිනින්. නාට්‍යයේ නම 'බූරුවා මහත්තයා'. මාර්තු මාසේ 11, 12 ලුම්බිණියෙදි මුලින්ම වේදිකාගත කරනවා. මේ දවස්වල දිගටම ඒකේ රිහසල්ස්. ඒ අතරේ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයෙක් විදිහට වැඩ කරන ගමන් ම ජනසන්නිවේදනය පීඑච්ඩී එක කරගෙන යනවා.

**වයස හැට පැනලත් නාට්‍යකරුවෙක් විදිහට මේ තරම් කාර්ය බහුල ජීවිතයක් ගතකරන, ඔබ වේදිකා නාට්‍ය ක්ෂේත්‍රයට පිවිසුනේ මොන විදිහට ද?**

ඉස්කෝලෙ යන කාලේ තමයි මේකට පදනම වැටුණේ. මම මුලින්ම ගියේ අපේ ගමේ, දෙහිපේ ප්‍රාථමික පාසලට. එතනින් අස්වෙලා පොරමඩුල්ල සෙන්ට්‍රල් එකට යන කාලේ සුනිල් ශ්‍රියානන්ද කියන සර් නාට්‍යයක් නිෂ්පාදනය කළා අස්පගුඩුං කියලා. ඒකේ චරිතයකට මාව තෝරාගත්තා. මේ නාට්‍ය හැටහයේ සමස්ත ලංකා අන්තර් පාඨශාලීය නාට්‍ය තරගයට ඉදිරිපත් කළාම මට හොඳම රංගන කුසලතාවට සහතිකයකුත් ලැබුණා. එතනින් තමයි නාට්‍යකරුවෙක් විදිහට මගේ ගමන පටන් ගන්නේ. ඉස්කෝලේ යන කාලෙම කුසලතා පිරි නළුවෙක් වුණාම ඉස්කෝලෙ කැපී පෙනන චරිතයක් බවට පත්වෙන්න ඇති නේද ?

කොහොමත් මට ඉස්කෝලේ කාලෙ යම් පිළිගැනීමක් තිබුණා. මොකද ඒ කාලේ මම ඉගනගන්න එකට වගේම බාහිර ක්‍රියාකාරකම්වලටත් දක්ෂ ළමයෙක්. මම කිසිම විභාගයකින ෆේල්වෙලා නෑ. සිංහල සාහිත්‍ය සංගමේ ලේකම් වුණොත් මම. හැටහයේ අවුරුද්දේ සෙන්ට්‍රල් එකේ විශිෂ්ටතම ක්‍රීඩකයා විදිහට තේරුණොත් මම. ඒ කාලේ පිරිමි නේවාසිකාගාරයේ ශිෂ්‍ය නායකය වුණොත් මම. ඒ නිසා තරමක් කැපී පෙනුන ශිෂ්‍යයෙක් කිව්වට වරදක් නෑ.

**මුලින්ම ප්‍රසිද්ධ වේදිකාවට එන්නේ ?**

උසස් පෙළ පාස්වෙලා මම පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුළ් වුණ කාලේ තමයි මහාචාර්ය සරච්චන්ද්‍ර සර් ඇමරිකා ගිහින් ඇවිල්ලා ආපහු නාට්‍ය කරන්න පටන් ගත්තේ. මට මතක හැටියට හැටහයේ මම කැම්පස් ගියේ. හැටහතේ සර්ගේ සිංහබාහු නාට්‍යයේ නව නිෂ්පාදනයේ පොඩි චරිතයක් කරන්න ලැබුණා. ඊළගට මනමේ නාට්‍යයෙත් කොරස් කියන එකකට වගේ සම්බන්ධ වුණා. 'ප්‍රේමතී ජායතෝ සෝකෝ' නාට්‍ය නිෂ්පාදනය කරන්න ලෑස්තිවෙලා එතුමා ඒකට නලු නිළියන් ගන්න සම්මුඛ පරීක්ෂණයක් තිබ්බා. මමත් ඒකට ඉදිරිපත් වුණා. එතුමගේ නාට්‍යවල මූලික දෙයක්නෙ ගීත. ඉතිං සම්මුඛ පරීක්ෂණයෙදීත් මූලිකවම බැලුවේ ගීත ගායන හැකියාව තියනවද කියන එක. මමත් ඉදිරිපත්වෙලා ගීතයක් ගායනා කළා. ඒකෙන් 'ප්‍රේමතී ජායතෝ සෝකෝ' නාට්‍යයේ ප්‍රධාන චරිතයට මාව තෝර ගත්තා. ඒක තමයි මුලින්ම ප්‍රසිද්ධ වේදිකාවේ චරිතයක් විදිහට මම කළේ. එතනින් තමයි මම ප්‍රසිද්ධ වේදිකාවට එන්නේ. ඊට පස්සේ දිගින් දිගටම මට විවිධ නාට්‍යකරුවන්ගේ නාට්‍යවල චරිත කරන්න අවස්ථා ලැබුණා. මේ වෙනකොට ලංකාවේ ඉන්න නාට්‍යකරුවන් හැමකෙනෙක් එක්කම වගේ මම වැඩකරලා තියනවා. හඳගම, නිරිඇල්ල වගේ කීපදෙනෙක් ඇරුණාම.

**නාට්‍යය 'ප්‍රේමතී ජායතී සෝකෝ' වුණාට මොකද ප්‍රධාන නලුවට ඒක එහෙම වුණේ නෑ කියනව නේද ?**

ඔව් ඔව්. ඔය නාට්‍ය කරගෙන යන අතරේ ඒකේ ප්‍රධාන නිලිය තමරා ජයන්තිත් එක්ක මගේ ප්‍රේම සම්බන්ධයක් ඇතිවුණා. අන්තිමේ මම එයාව විවාහ කරගත්තා. දැන් අපිට දරුවෝ දෙන්නෙක් ඉන්නවා. දෙන්නම ලොකු ළමයි. ඒ දෙන්න දැන් ඉන්නේ ඔස්ට්‍රේලියාවේ. එක්කෙනෙක් විවාහවෙලා.

**ගායන හැකියාවකුත් තියෙද්දි ඇයි ගායකයෙක් නොවී නාට්‍යකරුවෙකු බවට පත්වෙන්නේ ?**

මම නාට්‍ය යොදාගන්නේ සමාජ ප්‍රශ්ණ ගැන සමාජයත් එක්ක කතා බහ කරන්න මාධ්‍ය විදිහටයි. මම අද දකින සමහර කාරණා ගැන මට තියනවා සමාජයත් එක්ක කිසියම් කතා බහක්. ඒ ප්‍රශ්ණ ගැන මට දැනෙන දේ සමාජයට කියන්න මට ඕනේ. ඒ සඳහා වඩා හොඳ මාධ්‍යයක් විදිහට මම තෝරාගත්තේ නාට්‍ය. මගේ ගුරු තරුව තල මල පිපිලා වගේ හැම නාට්‍යකින්ම මම කළේ වර්ථමාන සමාජයේ තියන ප්‍රශ්ණ ගැන කතා කරන එකයි. මේ කාරණයට වෙනත් මාධ්‍යත් යොදාගන්න පුළුවන්. ගීතය වුණත් යම් ආකාරයකින් යොදාගන්න පුළුවන්. ඊට වඩා පුළුල් ආකාරයෙන් නාට්‍ය යොදාගන්න පුලුවන්. අනෙක් කාරණය මම කලා ක්ෂේත්‍රයට එන්නෙමත් නාට්‍යත් එක්කනේ. ඒ නිසා දිගටම ඒ ගමන නාට්‍ය එක්කම ඉදිරියට ආවා.

**විශ්ව විද්‍යාලයෙන් උපාධිධාරියෙකු විදිහට පිටවෙන ඔබ මේ විදිහට වේදිකාව මත තමන්ගේ කලා ජීවිතය ගොඩනගා ගනිද්දි පෞද්ගලික ජීවිතය ගොඩනැගුණේ කොයි ආකාරයෙන් ද ?**

විශ්ව විද්‍යාලයෙන් ඇවිල්ලා මම මුලින්ම අනියම් ලිපිකරුවෙකු විදිහට පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ රස්සාවකට බැඳුනා. ඊට පස්සේ ලිපිකරුවෙක් විදිහට රස්සාව ස්ථිරවෙලා පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවෙයි වරාය කොමිසන් සභාවෙයි කාලයක් වැඩ කළා. ඊළගට ප්‍රජා සංවර්ධන නිලධාරි කෙනෙක් විදිහට මහවැලි අධිකාරියට බැදුණා. ඔය විදිහට කලාව එක්ක රස්සාවත් කරගෙන ගියා. ඒ අතරේ කසාද බැන්දා. දරුවෝ ලැබුණා. කාලයක් යනකොට කලා ක්ෂේත්‍රයේ වැඩ නිසා රැකියාව කරගෙන යන එක ගැටළුවක් වුණා. ඊට පස්සේ රස්සාවෙන් අස්වෙලා පූර්ණ කාලීනව කලාවට යොමුවුණා.

**වේදිකාවෙන් පස්සේ ඔබ සිනමාවටත් සම්බන්ධ වෙනවා. කොහොමද ඒ ?**

ටයිටස් තොටවත්ත මහත්තයා 'හඳයා' ළමා චිත්‍රපටිය කරන කාලේ ඒකෙ චරිතයක් කරපු කිත්සිරි මෙවන් එක්ක මමත් එකම තැනක තමයි ඒ කාලේ නැවතිලා හිටියේ. හඳයා චිත්‍රපටියේ තියනවා 'සූප්පුවා' කියලා පොඩි චරිතයක්. එනවුන්ස් කරන කොටසක් තමයි මේකේ තියෙන්නේ. ටයිටස් මහත්තයා මේකට නළුවෙක් හොයන වෙලාවේ කිත්සිරි කියලා තියනවා අපිත් එක්ක ඉන්නවා මෙහෙම කෙනෙක් එක්ක එන්නද කියලා. ඒ විදිහට කිත්සිරි තමයි මුලින්ම මාව ටයිටස් මහත්තයා ලගට එක්ක ගියේ. මාව දැකපු ගමන්ම ටයිටස් මහත්තයා ඒ චරිතෙට මාව සුදුසුයි කියලා තෝරගත්තා. මට මතක හැටියට මම මුලින්ම චිත්‍රපටියක රගපෑවේ ඒකෙ. ඔය කාලෙම වගේ සුනිල් ආරියරත්න කරපු 'සිරිබෝ අයියා' චිත්‍රපටියෙත් මට චරිතයක් කරන්න ලැබුණා. ඒ කාලෙ වෙනකොට සුනිල් ආරියරත්න මා හදුනගෙන හිටියා. ඒ විදිහට තමයි සිනමාට සම්බන්ධ වුණේ. ඊට පස්සේ චිත්‍රපටි පහළොවක දාසයක විතර රගපෑවා. හිරිපොද වැස්ස, සමනළ තටු, හේරුණ්ඩ පක්ෂියා වගේ ඒවා තමයි අන්තිමට සම්බන්ධ වුණ චිත්‍රපටි.

**රූපවාහිනී නාට්‍යත් විශාල සංඛ්‍යාවකට ඔබ රංගනයෙන් දායකවෙලා තියනවා. ඒ වගේම ටෙලි නාට්‍ය කීපයක් අධ්‍යක්ෂණය කරලත් තියනවා. මේ විදිහට වේදිකාව සිනමාව රූපවාහිනිය කියන මාධ්‍ය තුනේම එකවර නියැළෙමින් ඉන්න අතරේ අධ්‍යාපන කටයුතු කරගෙන යන්නෙ කොහොමද?**

ආචාර්ය උපාධියක් ලබාගැනීම දක්වා අධ්‍යාපන කටයුතු ඉදිරියට ගෙනියන්න පුලුවන් වුණේ ?
මම අර කලින් කිව්වේ ඉස්කෝලේ යන කාලේ මම ඉගෙන ගන්න ටිකක් දක්ෂ කෙනෙක් කියලා. මම කවදාවත් කිසිම විභාගයකින් ෆේල් වෙලා නෑ. පේරාදෙණියෙන් බී ඒ එක අරගෙන කොළඹ ආවට පස්සේ මම ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ජනසන්නිවේදනය එම් ඒ එක කරා. ඊට පස්සේ ඒකෙන්ම පී එච්ඩී එකත් කළා. ඔය අතරේ ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජනසන්නිවේදනය පශ්චාත් උපාධි ඩිප්ලෝමා එකත් කළා. කොළඹ විශ්ව විද්‍යාලයෙන් ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවකුත් ගත්තා. මම මොන දේ කළත් ඒ අතරේ ඇකඩමික් පැත්ත අත්නොහැර දිගටම කරගෙන ගියා.
කලා ක්ෂේත්‍රවලින් නමක් හදාගන්න සැළකිය යුතු පිරිසක් දෙවැනි අදියරේදී දේශපාලනයට එක්වීම වර්ථමානයේ සුලබව දකින්න ලැබෙන කාරණයක්.

මනෝරත්නගේ දේශපාලනය මොනවගේ ද...?
නාට්‍යකරුවෙක් විදිහට මම කරන්නෙත් දේශපාලනයක් තමයි. මගේ නාට්‍ය තුළින් මම සාකච්ඡාවට ලක් කරන්නේ අපිට දැනෙන, පෙනෙන සමාජීය ගැටළු, අර්බුධ ගැන. ඒ හැමදෙයක්ම දේශපාලනිකයි. නමුත් ඔබ අහන්නේ

සංවාදය සහ සේයා රූ
ශ්‍රීලාල් සෙනෙවිරත්න

පක්ෂ දේශපාලනය ගැන නම් මගේ අදහස කලාකරුවෙක් විදිහට පක්ෂ දේශපාලනයේ යෙදීම මට තරම් නොවෙන කටයුත්තක් කියන එකයි. කලාකරුවෙක් විදිහට මම මගේ ප්‍රේක්ෂකයන් එක්ක සෘජුවම දේශපාලනය කතාකරනවා. ඒ සම්බන්ධයෙන් මගේ තියන ආකල්පය, දැක්ම සාකච්ඡාවට ලක්කරනවා. මම මේ ගනුදෙනුව කරන ප්‍රේක්ෂක සමාජය කියන්නේ විවිධ දේශපාලන මතවාද දරන කණ්ඩායම් රාශියකින් සැදුම්ලත් එකක්. මම පක්ෂ දේශපාලනයට යනවා කියන්නේ මගේ ප්‍රේක්ෂක සමාජයේ කිසියම් කණ්ඩායමකට, කුලකයකට එකතුවීමක්. එතකොට මම කොහොමද අනෙක් කණ්ඩායම් එක්ක මගේ සාකච්ඡාව ගෙනියන්නේ. ඒ කණ්ඩායම් මගේ දේශපාලන විරුද්ධවාදීන් බවට පත්වුණාම කලාකරුවෙක් විදිහට මට සමාජයත් එක්ක සිදුකළ යුතු සාකච්ඡාව පුළුල් පරාශකින් කරගන්න බැරිවෙනවා. අනෙක් පැත්තෙන් මා තුළ සිටින කලාකරුවා ක්ෂයවෙලා දේශපාලකයෙක් මතුවෙන්න පටන් ගනියි. එතනින් මගේ අනන්‍යතාව අහෝසි වෙනවා. මේ කාරණා නිසා මම කොහොමටවත් පක්ෂ දේශපාලනයට සම්බන්ධ වෙන්න හිතන්නෙ නෑ.